**සෞම්‍ය මූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනම - 2013**

-------------------------------------------------------------

සෞම්‍ය මූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනමේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2005 අංක 19 දරන සෞම්‍ය මූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනම පනතේ 11(2) වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර පදනමේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

-------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලැසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මත සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස පදනමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් පදනමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

--------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට සෞම්‍ය මූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ**

(අ) සම්පූර්ණයෙන් ක්ෂය වී තිබුණු නමුත් පදනම විසින් තවදුරටත් භාවිතා කරනු ලබන පිරිවැය රු. 6,557,901 ක් වූ යතුරුපැදි 57 ක් ප්‍රත්‍යාගණනය කර සාධාරණ අගය ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2005 වර්ෂයේදී පදනමට පවරා දී තිබුණු වටිනාකම රු. 272,000,000 ක්වූ ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම් වෙන් වෙන්ව හඳුනා ගැනීමකින් තොරව මුළු වටිනාකමින් සියයට 50 ක් ගොඩනැගිලි ලෙස සලකා ක්ෂය කර තිබුණි.

#### 2.2.2 පැහැදිලි නොකල වෙනස්කම්

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව රේඛීය අමාත්‍යාංශයෙන් ප්‍රතිපූර්ණය කළ යුතු මුදල රු.11,439,786 ක් ලෙස දක්වා තිබුණද රේඛීය අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම අනුව එම බැරකම රු.13,726,972 ක් ලෙස දක්වා තිබීම නිසා රු.2,287,186 ක්වූ වෙනස හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.3 ලැබිය යුතු හා ගෙවියයුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2010 වර්ෂයේදී පුද්ගලයින් 05 දෙනෙකු වෙත ණය පදනම මත ලබා දී තිබුණු රු.1,723,450 ක් වටිනා ත්‍රීරෝද රථ 5 කින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.504,259 ක් වූ ණය වාරික හා රු.74,934 ක් වූ රක්ෂණ වාරික අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2012 වර්ෂයේ පැවැත්වූ දැයට කිරුළ උත්සවය වෙනුවෙන් ඉදිකළ වෙළඳ කුටි සඳහා ගෙවිය යුතු රු.393,538 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටද නිරවුල් කර නොතිබුණි.

### 2.4 නීතිරීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීතිරීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| නීතිරීති හා රෙගුලාසිවලට යොමුව | | අනුකූල නොවීම |
| --- | --- | --- |
| (අ) | 2005 අංක 19 දරන සෞම්‍ය මූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනම පනතෙහි 10 වගන්තියේ 2,3,4 ඡේද | ස්වකීය බලතල හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේදී හා ඉටු කිරීමේදී දරන සියලු වියදම් පදනම ගොඩ නගා ගත් අරමුදලින් දැරිය යුතු වුවත් පදනම විසින් දරන ලද සියලු වියදම් අදාල රේඛීය අමාත්‍යාංශයෙන් ප්‍රතිපූර්ණය කරගෙන තිබුණි. සභාපතිවරයාගේ පිළිතුරට අනුව පනතේ එසේ සඳහන් වුවත් පදනමෙන් උපයන මුදල් ප්‍රමාණවත් නොවන බැවින් පදනම ආරම්භයේ සිට රේඛීය අමාත්‍යාංශය හරහා පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් සඳහා රජයෙන් මුදල් ලබා දෙන බවත් සමාලෝචිත වර්ෂයට පදනම ඉපයූ මුදල රජයේ ප්‍රදාන වලින් සියයට 4 ක් පමණවූ මුදලක් බවත් දක්වා තිබුණි. |
| (ආ) | 1998 දෙසැම්බර් 31 දරන සේවක අර්ථසාධක අරමුදල් සංශෝධිත පනතේ IIකොටසේ 10 (1) හා (2) ඡේද | 2012 වර්ෂයේ නොවැම්බර් මාසයේ සිට 2013 වර්ෂය දක්වා එකතුව රු.6,124,786 ක්වූ සේව්‍ය සේවක අර්ථසාධක අරමුදල් දායකය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වාම අරමුදල වෙත ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | (i) මුදල් රෙගුලාසි 371 | අදාල කාර්යය නිමකළ විගස ලබා ගත් අත්තිකාරම් නිරවුල් කළ යුතු වුවද, ප්‍රජා ශක්ති ව්‍යාපෘතියේ කළමනාකරුට 2011 හා 2013 වර්ෂවලදී ලබාදී තිබුණු අත්තිකාරම් පිළිවෙලින් එකතුව රු.318,867 ක් හා එකතුව රු.118,071 ක් 2013 දෙසැම්බර් 31 දින වන විටත් පියවීමට කටයුතු කර නොතිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 371(2)(ආ) | තත්කාර්ය අතුරු අග්‍රිම රු.20,000 සීමාව ඉක්මවා ලබා නොදියයුතු වුවද, එයට පටහැනිව නිලධාරීන් තිදෙනෙකුට අවස්ථා 11 කදී එකතුව රු.1,172,450 ක තත්කාර්ය අතුරු අග්‍රිම ලබා දී තිබුණි. |
| | (iii) මුදල් රෙගුලාසි 756 | පදනමේ සියලු අංශ ආවරණය වන පරිදි සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පවත්වා වාර්තා විගණකාධිපති වෙත එවීමට කටයුතු කර නොතිබුණි. |
| (ඈ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 හා 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛ | 2013 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.387,020,038 ක්වූ ස්ථාවර වත්කම් සහ පරිගණක හා මෘදුකාංග සඳහා ස්ථාවර වත්කම් ලේඛන පවත්වා ගෙන ගොස් නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ පදනමේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.50,661,764 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.54,307,157 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,645,393 ක වර්ධනයක් විය. ප්‍රදාන සහ වෙනත් හුවමාරු ගෙවීම් රු.3,012,041 කින් අඩුවීම මෙම වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රජාශක්ති හා නවශක්ති ව්‍යාපෘතිය යටතේ පුද්ගලයින් 50,000 කට තොරතුරු තාක්ෂණ පුහුණුව හා තරුණයින් 250 කට රැකියා අවස්ථා ලබාදීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.78,000,000 ක් වැය කිරීමට සැලසුම් කර තිබුණද, කාර්යසාධන වාර්තාවට අනුව පුද්ගලයින් 36,140 කට පමණක් තොරතුරු තාක්ෂණ පුහුණුව ලබාදීම සඳහා රු.60,236,726 ක් වැයකර තිබුණි.

(ආ) තොණ්ඩමන් සංස්කෘතික මධ්‍යස්ථානයේ විවිධ සංස්කෘතික වැඩසටහන් සඳහා එක් පුහුණුලාභියෙකු වෙනුවෙන් රු.62,500 බැගින් පුහුණුලාභීන් 240 දෙනෙකු සඳහා රු.15,000,000 ක් ඇස්තමේන්තු කර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂයේ දී 45 දෙනෙකුට පමණක් පුහුණුව ලබාදීම වෙනුවෙන් රු.8,439,391ක් වැයකර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුල රු. 6,000,000 ක් වැයකර තරුණ තරුණියන් 1,500 කට නෝවුඩ් ක්‍රීඩා සංකීර්ණයේ ක්‍රීඩා පහසුකම් සැපයීමට සැලසුම්කර තිබුණද, සමාලෝචිත වර්ෂයේදී ක්‍රීඩා පහසුකම් සඳහා ලියාපදිංචි වී තිබුණු තරුණ තරුණියන් 95 දෙනා වෙනුවෙන් පදනම විසින් රු.2,679,494 ක් වැයකර තිබුණි.

### 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දින දක්වාම පදනම විසින් පවත්වාගෙන යනු ලබන ප්‍රජාශක්ති මධ්‍යස්ථාන 42 ක අයිතිය පවරා ගැනීමට කටයුතුකර නොතිබියදී හා ඉඩම් අයිතිය පවරා ගැනීමකින් තොරව තවත් ප්‍රජාශක්ති මධ්‍යස්ථාන 35 ක් ඉදිකිරීමට 2012 වර්ෂයේදී ඉඩම් මැනුම් කටයුතු වෙනුවෙන් රු. 2,359,298 ක් වැය කර තිබුණි.

(ආ) 2005 අංක 19 දරන පදනම පිහිට වූ පනතේ 10(2) වගන්තිය යටතේ පදනමට පවරාදී තිබුණු ඉඩම් හා ගොඩනැගිලි සඳහා ඔප්පු පිළියෙල කිරීම 2015 දෙසැම්බර් වන විටත් සිදුකර නොතිබුණි.

(ඇ) ප්‍රජාශක්ති ව්‍යාපෘතිය යටතේ තෝරාගත් ප්‍රදේශ කිහිපයක ක්ෂේත්‍ර සම්බන්ධීකරණ කටයුතු සඳහා අමාත්‍යාංශය විසින් පදනම වෙත රු.20,484,000 ක් ලබා දී තිබුණි. පත්වීම් ලිපියක් හෝ නිශ්චිත කාර්ය පැවරුමක් නොමැතිව හා සත්‍ය වශයෙන් ඉටුකළ රාජකාරි කටයුතු පිළිබඳ තහවුරු කිරීමකින් තොරව නිලධාරීන් 90 දෙනෙකු වෙත 2010 වර්ෂයේ සිට 2013 අප්‍රේල් දක්වා කාලපරිච්ඡේදය සඳහා එම මුළු මුදලම ගෙවා තිබුණි.

(ඇ) ඉහත සඳහන් පරිදි ක්ෂේත්‍ර සම්බන්ධීකරණ කටයුතු සම්බන්ධයෙන් පැවති දුර්වල කළමනාකරණය හේතුවෙන් පදනමේ ව්‍යාපෘති කළමනාකරු හා ව්‍යාපෘති සම්බන්ධීකාරක විසින් 2011 අප්‍රේල් සිට 2013 අප්‍රේල් දක්වා කාලපරිච්ඡේදය සඳහා ව්‍යාජ නම් ඉදිරිපත් කර ඔවුන්ගේ පෞද්ගලික බැංකු ගිණුම්වලට සම්බන්ධීකාරක දීමනාවලින් රු.4,252,500ක් බැර කරගෙන තිබීම සම්බන්ධයෙන් සිදුකරන ලද විමර්ශණයකින් පසුව එම නිලධාරින් මුදල් ආපසු ගෙවීමට එකඟ වී තිබුණද 2014 මැයි 25 වන දින වනවිට රු.1,050,000 ක් පමණක් ගෙවා තිබුණි. ඉතිරි රු. 3,202,500ක් වූ මුදල් අයකර ගැනීම සඳහා එම නිලධාරීන්ට විරුද්ධව නඩු පවරා ඇතත්, ඒ සම්බන්ධයෙන් ගිණුම්වල හෙළිදරව් කර නොතිබුණි. තවද 2010 වර්ෂයේ සිට 2011 මාර්තු දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී ක්ෂේත්‍ර සම්බන්ධිකාරක දීමනා රු.5,265,000 ක් පෞද්ගලික බැංකු ගිණුම්වලට බැර කර තිබීමට අදාලව පදනම විසින් විමර්ෂණයක් පවත්වා නොතිබුණි.

**4.3 නිෂ්ක්‍රීය වත්කම්**

-------------------

2007, 2008 හා 2009 වර්ෂවලදී ප්‍රජාශක්ති ව්‍යාපෘතිය යටතේ ප්‍රජාශක්ති මධ්‍යස්ථාන 42 කට අන්තර්ජාල සේවා සැපයීම, ඒ සඳහා උපදේශන ගාස්තු ගෙවීම, V-SAT ඇන්ටනා උපකරණ කට්ටල 42 ක් මිලදී ගැනීමට එම උපකරණ නඩත්තු හා අළුත්වැඩියා කිරීම සඳහා රු.131,404,288 ක් වැයකර තිබුණද 2014 මාර්තු 01 දින සිට එම සේවාව ලබා ගැනීම නවතා දැමීම හේතුවෙන් එම උපකරණ කට්ටල 42 විගණිත දිනය වූ 2016 මැයි දක්වා නිෂ්ක්‍රීයව පැවතුණි. කෙසේවුවද මෙම සේවාව නවතා දැමීම සඳහාවූ අධ්‍යක්ෂක මණ්ඩල තීරණය විගණනයට ඉදිරිපත් නොවීය.

**4.4 නොවිසඳී ඇති විගණන ඡේද**

-----------------------------------

වැවිලි මානව සංවර්ධන භාරය විසින් 2008 වර්ෂයේ පැවැත්වූ උත්සවයක් සඳහා ඉන්දියාවෙන් ආනයනය කර තිබුණු පොත් වෙනුවෙන් භාරය විසින් ගෙවියයුතු රු.90,577 ක් පදනම විසින් ගෙවා තිබූ අතර එම මුදල් 2013 දෙසැම්බර් 31 දින දක්වාම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.5** හඳුනාගත් පාඩු

----------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සේවක භාරකාර අරමුදලට දායක මුදල් ප්‍රේෂණය කිරීම ප්‍රමාද වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.105,448 ක අධිභාරයක් ගෙවීමට සිදු වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුලදී බැංකු අයිරා පොලී රු.409,787 ක් ගෙවා තිබුණි.

**4.6 කාර්ය මණ්ඩල පරිපාලනය**

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) තොණ්ඩමන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය හා එම කාර්ය මණ්ඩලයේ වැටුප් ප්‍රමාණ අනුමත කරගෙන නොතිබුණි.

(ආ) ඉදිරිපත් කරන ලද තොරතුරුවලට අනුව ප්‍රධාන කාර්යාලයේ හා අනුමත ව්‍යාපෘති 03 ක 2013 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 232 ක් වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 188 ක් වූයෙන් පුරප්පාඩු 44 ක් විය. මේ සම්බන්ධයෙන් පහත සඳහන් තොරතුරු නිරීක්ෂණය විය.

(i) ප්‍රධාන කාර්යාලයේ ගණකාධිකාරී තනතුර ඇතුළුව තනතුරු 06ක පුරප්පාඩු පැවති බැවින් 2014 හා 2015 වර්ෂයන්ට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 30 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ii) තොන්ඩමන් ක්‍රීඩාසංකීර්ණ ව්‍යාපෘතිය සඳහා 2013 වර්ෂයේදී තනතුරු 12 ක් වෙනුවෙන් නිලධාරීන් 35ක කාර්ය මණ්ඩලයක් අනුමතකර තිබුණද නිලධාරීන් 32 දෙනෙකු පත්කර නොතිබීම හේතුවෙන් එම ව්‍යාපෘතියේ අරමුණු ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී බඳවා ගැනීමේ පරිපාටිය උපදේශකවරයෙකු විසින් පිළියෙල කර තිබුණද 2015 වර්ෂය අවසානය වන විටත් එය අනුමත කරගෙන නොතිබුණි.

(ඈ) 2007 අගෝස්තු 24 දිනැති අංක 09/2007(i) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව විධිමත් අනුමැතියකින් තොරව වයස අවුරුදු 60 ඉක්මවූ නිලධාරීන් දෙදෙනෙකු කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවාගෙන සමාලෝචිත වර්ෂය තුළදී දීමනා ලෙස එකතුව රු.2,098,800 ක් ගෙවා තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1 ගිණුම් ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන මුදල් වර්ෂය ඉකුත්වී දින 60 ක් ඇතුලත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් පදනම විසින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මාස 16 ක් ප්‍රමාද වී 2015 ජූනි 30 දින ඉදිරිපත් කර තිබුණි.

### 5.2 අභ්‍යන්තර විගණනය

2009 ජුනි 09 හා 2011 දෙසැම්බර් 23 දිනැති පිළිවෙලින් අංක DMA/2009(1) හා DMA/ADM/2011/1/26 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛ කෙරෙහි අවධානය යොමුකර කාර්යක්ෂම අභ්‍යන්තර පාලන ව්‍යුහයක් ඇතිකර ගැනීම සඳහා අභ්‍යන්තර විගණන කාර්ය මණ්ඩලය ප්‍රයෝජනයට නොගෙන අභ්‍යන්තර විගණක විසින් ගණකාධිකාරි තනතුරේ වැඩ ආවරණය කර තිබුණි. අභ්‍යන්තර විගණන නිලධාරීන් ගිණුම් අංශයේ රාජකාරි ඉටුකිරීම නිසා සමාලෝචිත වර්ෂය තුල අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

### 5.3 අයවැය ලේඛනමය පාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පදනම විසින් පිළියෙල කරන ලද අයවැය ලේඛනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(ආ) අයවැයගත ආදායම් හා වියදම් තත්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී සැලකියයුතු විචලනයන් වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

### 5.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම

පදනම ආරම්භකළ 2005 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

-----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර පදනමේ සභාපතිවරයා වෙත යොමුකරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් පිළිබඳව විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

(අ) කොන්ත්‍රාත් පරිපාලනය
(ආ) කාර්ය මණ්ඩල පරිපාලනය
(ඇ) මූල්‍ය පාලනය
(ඈ) අයවැය පාලනය
(ඉ) වත්කම් පරිපාලනය